**කොවිඩ් 19 සති පාසල සබරගමු පළාත**

9 ශ්‍රේණිය - පුරවැසි අධ්‍යාපනය

**ඒකකය 3 - ප්‍රජාතන්ත්‍රවාදී පාලනය**

**පැවරුම් අංක 4 – 6 වන සතිය (2021.07.05-2021.07.09)**

**ක්‍රියාකාරකම 9.3.3 -** ජන සමාජයක එක්සත් බව ඇති කිරීමට දේශපාලන පක්ෂ මඟින් ඉටු කළ යුතු කාර්යභාරය හඳුනාගැනීම.

**හැඳින්වීම -** පොදු ප්‍රතිපත්තියක් අනුව කටයුතු කරමින් පාලන බලය ලබා ගැනීම සඳහා සංවිධානය වූ පුද්ගල කණ්ඩායමක් දේශපාලන පක්ෂයක් ලෙස සරලව නිර්වචනය කළ හැකිය. විවිධ රටවල ක්‍රියාත්මකවන දේශපාලන පක්ෂ ක්‍රම හා ඒවායේ කාර්යභාරයන් කාර්යභාරයන් මෙහිදී හඳුනාගත හැකිය.

**ගුණාත්මක යෙදවුම් -** පෙළපොත/සටහන් පොත /පෑන් / ඡන්ද පත්‍රිකා සමග බෙදන පක්ෂ නාම ලේඛනයක්

**ක්‍රියාකාරකම් සඳහා සිසුන්ට උපදෙස් -**

පියවර 1 - පෙළ පොතේ පිටු අංක 76-79 දක්වා අවබෝධයෙන් කියවන්න.

පියවර 2 - කලින් අවස්ථාවල මෙන්ම අභ්‍යාස පොත භාවිතා කර ප්‍රශ්න ලියා පිළිතුරු සපයන්න.

**ප්‍රශ්නාවලිය**

1. මොරිස් ඩුවයිජර් විසින් දේශපාලන පක්ෂ පිළිබඳ ඉදිරිපත් කර ඇති නිර්වචනය කුමක්ද?
2. පක්ෂ පිළිබඳ නිර්වචන සැලකිල්ලට ගෙන ඔබ විසින් දේශපාලන පක්ෂයක් යන්න හැඳින්වීමට පොදු නිර්වචනයක් ගොඩනගන්න.
3. දේශපාලන පක්ෂයකට අයත් වන කාර්යයන් පහක් ලියන්න.
4. දේශපාලන පක්ෂයක් විසින් ඉටු කළ යුතු කාර්යයන් තුනක් ලියන්න.
5. ලෝකයේ ක්‍රියාත්මක වන දේශපාලන පක්ෂ ක්‍රම හඳුන්වා උදාහරණ රටවල් දෙක බැගින් දෙන්න.

**පසුවැඩ**

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකවන දේශපාලන පක්ෂ නාම ලේඛනය ද අධ්‍යයනය කර වැඩිහිටි අයගෙන් තොරතුරු රැස් කරගෙන රටේ සංවර්ධනයට දේශපාලන පක්ෂවල දායකත්වය මැයෙන් ලිපියක් සකස් කරන්න.

(මේ විෂය විෂයභාර ගුරුභවතා ට නිර්ණායක මූලික තක්සේරුකරණය හා ඇගයීම ට උපයෝගී කරගත හැකිය.)

පාසල ආරම්භ වූ වහාම මෙම අභ්‍යාස පුරවැසි අධ්‍යාපන විෂය භාර ගුරුභවතාට පෙන්වීමට සලස්වන්න.

ඉදිරිපත් කිරීම

ර/ ශ්‍රී රත්නාකර මහා විද්‍යාලයේ පුරවැසි අධ්‍යාපන විෂය භාර

ආචාර්ය එම්.ඒ.පත්මලතා මිය